(21)

<u>දකුණු පළාත් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය - සංශෝධන 01</u>

අනුමත අංක 192 හා 2014.09.11 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඡේද පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**01. 7.3.2.3 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.**

7.3.2.3 පළපුරුද්ද

නියමිත දිනට දකුණු පළාත් රජයේ සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට තිබිය යුතුය.

(මේ යටතේ වූ පැහැදිලි කිරීම එසේම පවතිනු ඇත)

**02. 7.3.2.5 වගන්තිය යටතේ සඳහන් අනුවගන්තීන්හි අවසානයට අනු අංක (iv) ලෙස පහත වගන්තිය ඇතුළත් කරනු ලැබේ**

7.3.2.5 වෙනත්

(iv) නියමිත දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. 8.3 වගන්තිය ඉවත් කර පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

8.3 පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල් හෝ පත්වීම් බලධරයා විසින් බලය පවරන ලද ආයතනයක්

**04. 10.3.1.1 ඡේදයේ (අ)(iii) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමත් සේවයේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරියෙකු වීම.

**05. 10.3.1.2 ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය

අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත්කිරීම් කරනු ලබන්නේ සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මතය. සීමිත තරඟ විභාගය සමත්වීම සඳහා විභාගයට අදාළ එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ. (විෂයය නිර්දේශය හා ලකුණු ලබා දීමේ පටිපාටිය 09 ඇමුණුමේ දැක්වේ)

ඩබ්. ජී. විදුර කාරියවසම
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත.

අනුමත අංකය: 192

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
20 17 / 11 / 28 දින අනුමත කොට ඇති බව
**සහතික කරමි.**

**පිටු ගණන** 02 කි

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

20 17 / 12 / 06

**06. 10.3.2.2 ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

10.3.2.2 උසස් කිරීමේ ක්‍රමය

අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත් කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලැබේ.මේ සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අවස්ථාවෝචිත ව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝගතා පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා සමත් විය යුතුය.එහි ප්‍රතිඵල මත හා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙළ අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ.දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙනු නොලැබේ. (ඇමුණුම 10)

**07. ඇමුණුම 04 යටතේ ඇති 'සටහන' කොටස වෙනුවට පහත සඳහන් කොටස ඇතුලත් කරනු ලැබේ.**

සටහන: 01

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමට අදාළ පරිගණක පරීක්ෂණයෙන් පහත අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් නිදහස් කරනු ලැබේ.

01. පහත ආයතන වලින් ලබාදෙන සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන පරිගණක පාඨමාලාවේ විෂයය නිර්දේශයට සමාන විෂයය නිර්දේශයක් යටතේ ඇති පරිගණක පාඨමාලා හදාරා ඇති නිලධාරීන්

a) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)
b) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
c) වෘත්තීය පුහුණු අධිකාරිය
d) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලා
e) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාල හෝ වෙනත් ආයතන
f) ජාතික තරුණ සේවා සභාව

02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යා උපාධිය හෝ උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති නිලධාරීන්

සටහන: 02

මෙම සංශෝධන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන දින සිට වසර 02 ක කාලයක් දක්වා අනුමත අංක 192 යටතේ දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2014.09.11 දිනැතිව අනුමත කරන ලද කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 04 හි සටහනේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් ද පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

යු. ජී. විදුර කාරියවස
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත.

අනුමත අංක 192
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017/11/28 දින අනුමත කොට ඇති බව සහතික කරමි.
පිටු ගණන 03 කි
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත
17/12

සකස් කළේ:
අත්සන : Nadeeka

නම: K. නදීකා දිල්රුක්ෂි
තනතුර: සංවර්ධන නිලධාරී
දිනය: 2017.10.03

පරීක්ෂා කළේ:
අත්සන :
(විෂයය භාර මාණ්ඩලික නිලධාරියා)
ආර්. යූ. අයි. දිසානායක
සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්)
නම: ප්‍රධාන ලේකම් කාර්යාලය
තනතුර: දකුණු පළාත
දිනය: 2017/10/03

යොමු අංකය SPS/2/6/2/8

දකුණු පළාත් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය ඛණ්ඩ 1 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය - සංශෝධන 01 ඉහත පරිදි සංශෝධනය කිරීම නිර්දේශ කරමි.

අත්සන:
නම: ආර්. සී. ද සොයිසා
(ප්‍රධාන ලේකම්)
ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

දිනය: 2017.10.04
නිල මුද්‍රාව:

යොමු අංකය:

දකුණු පළාත් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය ඛණ්ඩ 1 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය - සංශෝධන 01 ඉහත පරිදි 2017.10.11 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය කරන ලදී.

අත්සන:
නම: යූ.ජී. විදුර කාරියවසම්
(ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව)
යූ. ජී. විදුර කාරියවසම්
ලේකම්,
රාජ්‍ය සේවා කොමි...
...කුණු පළාත.

දිනය: 2017.10.17
නිල මුද්‍රාව:

අනුමත අංකය: 192
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
20 17 / 11 / 28 දින අනුමත කොට ඇති බව
සහතික කරමි.

පිටු ගණන 03 කි.

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

20 17 / 12 / 06